සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | ඉතිහාසය | කාලය : පැය දෙකයි |
| --- | --- | --- |

නම / විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ක්‍රිස්තු වර්ෂ 1602 දී මෙරටට ලන්දේසීන් පැමිණෙන විට උඩරට පාලකයා වූයේ,
1. දෙවන රාජසිංහ රජු ය
2. දෙවන විමලධර්මසූරිය රජු ය
3. පළමුවන විමලධර්මසූරිය රජු ය
4. පළමු රාජසිංහ රජු ය

(02) යුරෝපය හා ආසියාව අතර පැවැති ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ,
1. ජිනෝවා නගරය
2. රෝමය
3. කොන්ස්තන්තිනෝපල් නගරය
4. වැනීසිය

(03) රික්ස් ඩොලර් 120ට අඩු අලාභ සම්බන්ධ සිවිල් නඩු ද, විවාහ සම්බන්ධ නඩු ද විසඳනු ලබන්නේ,
1. රාද් වැන් ජස්ටිට්
2. සිවිල් රාද්
3. ලෑන් රාද්
4. පිස්කල් උසාවිය

(04) ලන්දේසීන් විසින් මෙරටට මුද්‍රණ යන්ත්‍රයක් ප්‍රථමයෙන් ම හඳුන්වා දෙන ලද වර්ෂය වන්නේ,
1. ක්‍රි.ව. 1736
2. ක්‍රි.ව. 1737
3. ක්‍රි.ව. 1738
4. ක්‍රි.ව. 1739

(05) ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන්නේ,
1. ෆෙඩ්රික් නෝර්ත්
2. තෝමස් මේට්ලන්ඩ්
3. රොබට් බ්‍රවුන්රිග්
4. විලියම් ග්‍රෙගරි

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(06) මහනුවර රාජධානි සමයේ දී දළදා මාළිගාවේ පත්තිරිප්පුව නිර්මාණය සඳහා අනුග්‍රහය ලබා දෙන ලද්දේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසිනි. (........)

(07) 1995 වර්ෂයේ දී රොබට් ඇන්ඩෲස් රාජාධිරාජසිංහ රජු හමු විය. (........)

(08) 1816 වර්ෂයේ දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇතුළු පිරිස ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී. (........)



CamScanner

(09) 1840 දී පනවන ලද ඉඩම් පනත මගින් උඩරට ගැමියන් පාරම්පරිකව භුක්තිවිඳි නීත්‍යනුකූල ලියකියවිලි නොමැති ඉඩම් රජයට පවරා ගන්නා ලදි. (........)

(10) 1922 වර්ෂයේ දී ජෝර්ජ් බර්ඩ් විසින් ගම්පොළ සිංහ පිටියේ දී ප්‍රථමවරට කෝපි වත්තක් ආරම්භ කරන ලදි. (........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය (අ) කොටස ඉදිරියෙන් ඇති වරහන තුළ ලියා දක්වන්න.**

| (අ) කොටස | | (ආ) කොටස |
|---|---|---|
| (11) 1638 ගිවිසුමට සම්බන්ධ ලාංකීය රජු, | (..........) | A) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු |
| (12) 1688 වන විට උඩරට පාලකයා වූයේ, | (..........) | B) ෆෙඩ්රික් නෝර්ත් |
| (13) ක්‍රි.ව. 1798 සිට 1802 දක්වා ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන්නේ, | (..........) | C) දෙවන විමලධර්මසූරිය රජු |
| (14) 1774 දී රජයේ නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණි ඉංග්‍රීසි ජාතිකයා, | (..........) | D) ජෝන් ඩොයිලි |
| (15) ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රජු වන්නේ, | (..........) | E) දෙවන රාජසිංහ රජු |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(පොන්නම්බලම් රාමනාදන් මහතා / පරමවිඥානාර්ථ සමාගම / ආරුමුග නාවලර් තුමා / කොළඹ තරුණ බෞද්ධ සංගමය / අනගාරික ධර්මපාල තුමා / ජෝන් ද සිල්වා)

(16) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ මගපෙන්වීම යටතේ ........................................................................ නමින් සංවිධානයක් මෙරට පිහිටුවන ලදී.

(17) ඩී. බී. ජයතිලක මැතිතුමා ........................................................................ පිහිටුවීමට පුරෝගාමී විය.

(18) ඉන්දියාවේ බුද්ධගයාව ඇතුළු පූජනීය ස්ථාන රැසක් ආරක්ෂා කර ගැනීමට .................................. .................................................. විසින් ක්‍රියා කරන ලදී.

(19) ........................................................................ විසින් 1872 වර්ෂයේ දී යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කරන ලදී.

(20) 1912 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම උගත් ලාංකික මන්ත්‍රීවරයා වශයෙන් .................................. .................................................. තෝරා පත්කර ගන්නා ලදී.

(ලකුණු 2 x 20 = 40)




CamScanner

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

(01) අ) පහත දැක්වෙන ස්ථාන දී ඇති ලංකා සිතියමෙහි ලකුණු කරන්න.



1. මහනුවර
2. මඩකලපුව
3. කොළඹ
4. මහවැලි ගඟ
5. මීගමුව

(ල. 2 x 5 = 10)

ආ) මෙහි සඳහන් රූපසටහන් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

1. i) A රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
   ii) ඔහු සම්බන්ධ වූ සටන කුමක් ද?
   iii) ඔහු සිටි රාජධානිය කුමක් ද?

(ල. 1 x 3 = 3)



B රූපය

2. i) B රූපයේ දැක්වෙන ශාකය කුමක් ද?
   ii) ඉන් නිෂ්පාදනය කරන ලද ඖෂධය කුමක් ද?
   iii) එම ඖෂධය යොදාගත්තේ කුමන රෝගය සඳහා ද?

(ල. 1 x 3 = 3)



CamScanner

ඇ) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i) 1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා වන්නේ කවුරුන් ද?
ii) හැමිල්ටන් ඇළ මාර්ගය ඉදිකරන ලද්දේ කුමන ජාතීන් විසින් ද?
iii) 1762 වර්ෂයේ දී ජෝන් පයිබස් ලංකාවට පැමිණෙන විට මෙරට පාලනය කළ උඩරට පාලකයා කවරෙක් ද?
iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ බිසව නම් කරන්න. (ල. 1 x 4 = 4)

(02) 1. ලන්දේසීන්ගේ පාලන සමයේ පැවති ප්‍රධාන කොමාන්ඩරි දෙකක් ලියන්න. (ල. 02)
2. ලන්දේසීන් විසින් විධිමත් කරන ලද තෝම්බු වර්ග තුනක් නම් කරන්න. (ල. 03)
3. ලන්දේසීන් විසින් හඳුන්වා දෙන ලද උසාවි පද්ධති තුනක් නම් කර, ඉන් එකක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 05)

(03) 1. ලන්දේසීන් මෙරට ආර්ථිකයේ ඇති කරන ලද ප්‍රතිසංස්කරණ දෙකක් ලියන්න. (ල. 02)
2. ලන්දේසීන් සිය රෙපරමාදු ආගම මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 03)
3. ලන්දේසීන් විසින් මෙරට සමාජයට හා සංස්කෘතියට එක් කරන ලද දායාද කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(04) 1. බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 02)
2. 1797 දී මුහුදු බඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලට බලපාන ලද හේතු තුනක් ලියන්න. (ල. 03)
3. 1797 අරගලය මර්දනය කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(05) 1. 1815 ගිවිසුමේ සඳහන් වගන්ති දෙකක් ලියා දක්වන්න. (ල. 02)
2. 1818 සටන සඳහා තුඩුදුන් හේතු තුනක් ලියන්න. (ල. 03)
3. 1818 සටන අසාර්ථක වීමට බලපෑ හේතු පහක් ලියා දක්වන්න. (ල. 05)

(06) 1. 1848 සටනට සම්බන්ධ නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
2. 1818 සටනට සම්බන්ධ නායකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)
3. 1848 නිදහස් සටනේ ප්‍රතිඵල පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)



CamScanner

## දෙවන වාර පරීක්ෂණය

**09 ශ්‍රේණිය** | **ඉතිහාසය** | **විසඳුම් පත්‍රය**


### I - කොටස

01. 3  02. 3  03. 2  04. 4  05. 1
06. ✗  07. ✗  08. ✓  09. ✓  10. ✗
11. E  12. C  13. B  14. D  15. A
16. පරමවිඥානාර්ථ සමාගම  17. කොළඹ තරුණ බෞද්ධ සංගමය  18. අනගාරික ධර්මපාල තුමා
19. ආරුමුග නාවලර් තුමා  20. පොන්නම්බලම් රාමනාදන් මහතා

(ලකුණු 2 x 20 = 40)

### II - කොටස

(01) අ)




(ල. 2 x 5 = 10)

ආ) 1. i) වීර කැප්පෙට්පොළ නිලමේ
ii) 1818 ප්‍රථම නිදහස් අරගලය
iii) මහනුවර රාජධානිය

(ල. 1 x 3 = 03)

2. i) සිංකෝනා
ii) ක්විනින්
iii) මැලේරියාව

(ල. 1 x 3 = 03)

ඇ) i) ජොරිස් වැන් ස්පිල්බර්ජන්
ii) ලන්දේසින්
iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
iv) රංගම්මා දේවිය

(ල. 1 x 4 = 04)

(මුළු ල. 20)

(02) 1. කොළඹ කොමාන්ඩරිය, ගාලු කොමාන්ඩරිය, යාපනය කොමාන්ඩරිය (ල. 02)

2. පවුල් තෝම්බුව, පාසල් තෝම්බුව, ඉඩම් තෝම්බුව (ල. 03)

3. රාද් වැන් ජස්ටිට් (මහාධිකරණය), සිවිල් රාද් (සිවිල් උසාවිය), ලැන් රාද් උසාවිය (ඉඩම් උසාවිය), පිස්කල් උසාවි (දිසාවේ උසාවි / ගම්පති උසාවි)

<u>රාද් වැන් ජස්ටිට් / මහාධිකරණය</u>

මෙය ලන්දේසි අධිකරණ පද්ධතියේ ඉහළ ම උසාවිය විය. මෙහි ප්‍රධානියා හුන්ට් අද්මිනිස්තාර් නමින් හැඳින්විය. අපරාධ නඩු විසඳීම මෙහි ප්‍රධාන කාර්යය වේ. මෙම උසවි, කොමාන්ඩරි තුනේම පිහිටුවා තිබුණි.

<u>සිවිල් රාද් උසාවිය</u>

සිවිල් රාද් හෙවත් සිවිල් උසාවිය ලන්දේසි පාලනය ආරම්භයේ සිට ම කොළඹ, ගාල්ල, යාපනය යන කොමාන්ඩරිවල පිහිටුවා තිබුණි. රික්ස් ඩොලර් 120ට අඩු අලාභ සම්බන්ධ සිවිල් නඩු ද විවාහ සම්බන්ධ නඩු ද මෙම උසාවිවල විභාග විය.



CamScanner

**ලෑන් රාද් / ඉඩම් උසාවිය**

ලෑන් රාද් හෙවත් ඉඩම් උසාවිය කොළඹ, ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, මාතර යන මධ්‍යස්ථානවල පිහිටුවා තිබුණි. දිසාවේවරයා මෙම උසාවිවල සභාපතිවරයා විය. දේශීය ජනතාවට සරල එමෙන් ම වියදම් අඩු, පහසු අධිකරණ ක්‍රමයක් ලෙස මෙම උසාවි ක්‍රමය ඇතැමුන් විසින් හඳුන්වනු ලබයි.

**පිස්කල් උසාවි/ දිසාවේ උසාවි/ ගම්පති උසාවි**

ලන්දේසි අධිකරණ පද්ධතිය තුළ පහළ ම උසාවි ලෙස මෙම උසාවි ක්‍රියාත්මක විය. පරිපාලන ක්ෂේත්‍රයේ පහළ නිලධාරීන් වූ ගම්මුලාදෑනි, විදානෙ, මුදලි, කෝරාල වැනි දේශීය නිලධාරීන්ට ද තම තනතුරුවලට අදාළ සුළු අධිකරණ බලතල තිබුණි. යාපන ප්‍රදේශයේ ද ජනතාව අතර පැවති සාම්ප්‍රදායික නීති රීති, නීති වශයෙන් සකස් කොට භාවිතයට ගැනිණ.

(ල. 05)

(මුළු ල. 10)

(03) 1. මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම, යෝධ වැව හා කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් වී නිෂ්පාදනය වැඩි කිරීමට උත්සාහ කිරීම, උක්, ගම්මිරිස්, එනසාල්, කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ ආදි වගාවන් දියුණු කිරීම, රෙදි විවීම, රෙදි සායම් කිරීම, උළු ගඩොල් වැනි කර්මාන්ත දියුණු කිරීම, හැමිල්ටන් ඇළ වැනි ඇළ මාර්ග ඉදි කොට ඒවා භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම, යාපනය ප්‍රදේශයේ දුම්කොළ වගා කරවීම හා තල් ගස් කඳන් වශයෙන් අපනයනය කිරීම (ල. 02)

2. ආගම් ප්‍රචාරය කිරීම සඳහා ඉස්කෝල නම් ආයතන විශේෂයක් ලන්දේසීන් විසින් ආරම්භ කළහ, රෙපරමාදු ආගමේ යාච්ඤාවලට පාසල් විෂය මාලාවේ ප්‍රධාන තැනක් ලැබී තිබිණි. මීට අමතරව දේවධර්මය විෂයක් වශයෙන් ඉගැන්වීමට සැලැස්වීම, පාසල් හා නම්බුනාම ලබාදීම මගින් සිංහලයින් තම ආගමට හරවා ගැනීම, දුප්පත් ජනතාවට උදව් කරමින් ඔවුන් ද තම ආගමට හරවා ගැනීම, පෘතුගීසි සොල්දාදුන් සිංහල කාන්තාවන් විවාහ කරගනිමින් ද ඔවුන් තම ආගමට හරවා ගැනීම. (ල. 03)

3. රෝම ගෘහ නිර්මාණ ශිල්පය අනුගමනය කරමින් ඉස්තෝප්පුව, සොල්දරය, කුලුණු හා උස් වහල යෙදූ නිවාස ඉදි කිරීම, විවිධ ආහාර වර්ග රාශියක් හඳුන්වාදීම උදාහරණ - කේක්, අච්චාරු, කොකිස්, උසාවි ක්‍රමය හඳුන්වා දීම, රෝම ලන්දේසි නීතිය හඳුන්වාදීම, මෙරට සමාජයට බර්ගර් (ලන්සි) ජනතාව එකතුවීම, සිංහල හා දෙමළ භාෂාවලට ලන්දේසි වචන විශාල ප්‍රමාණයක් එකතුවීම, ගෘහ නිර්මාණ ශිල්පයේ පහත සඳහන් වචන එකතුවීම

* සොල්දර * තරප්පු * බාල්ක * කාමර * ජනේල

* ඉස්තෝප්පු * ඉස්කුරුප්පු * අල්මාරි

* නීති ක්‍රමය හා උසාවි - නොතාරිස්, තෝල්ක

* වෙනත් වචන :- වෙන්දේසි, ඉස්කෝල, කුච්චාන්සි, කන්තෝරු, ඔප්පු, බූදල්

(ල. 05)

(මුළු ල. 10)

(04) 1. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම, ත්‍රිකුණාමල වරායේ වැදගත්කම, වෙළෙඳ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ තිබූ වැදගත්කම (ල. 02)

2. ඉංග්‍රීසි වෙළෙඳ සමාගම නව බදු වර්ග කිහිපයක් පැනවීම
(උදා - පොල් ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද)
බදු එකතු කිරීමේ දේශීය නිලධාරීන් ඉවත් කොට මදුරාසියෙන් ගෙන්වන ලද අවුමිල්දාර් නම් නිලධාරීන් යෙදවීම නිසා ජනතාව තුළ ඇති වූ විරෝධය, සාම්ප්‍රදායිකව තිබූ භාණ්ඩවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදු වීම හා මුදල් භාවිතය ප්‍රචලිත නොවූ නිසා ජනතාව ඉන් දැඩි පීඩාවට පත් වීම. (ල. 03)



CamScanner

3. එම කැරැල්ල මර්දනයට කර්නල් මියුරන් යටතේ කොමිසමක් පත් කරන ලදී. එය 'ද මියුරන් කොමිසම' නමින් හැඳින්වේ.

* පොල් ගස් බද්ධ ඉවත් කිරීම, බදු සහන ලබා දීම, බදු වෙන්දේසි ක්‍රමය ඉවත් කිරීම, නව බදු හඳුන්වාදීම, බදු එකතු කිරීමට විදේශීය නිලධාරීන් වෙනුවට දේශීය නිලධාරීන් පත් කිරීම

කැරැල්ල මර්දනය කිරීම සඳහා ඉහත ආකාරයේ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. (ල. 05)
(මුළු ල. 10)

(05) 1. ගිවිසුමේ වගන්ති දොළහකි.

දෙවැනි වගන්තිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් නෙරපන ලද බව ද ඔහුගේ සියලු ම ඥාතීන්ට උඩරට සිහසුන පිළිබඳ තිබූ සෑම අයිතිවාසිකමක් ම අහෝසි වූ බව ද සඳහන් වේ.

හතරවන වගන්තිය

උඩරට සාම්ප්‍රදායික නිලධාරීන් වූ මොහොට්ටාල, කෝරාල, විදානෙවරුන් ඇතුළු රදලයන් සතු තනතුරු හා අයිතිවාසිකම් ආරක්ෂා කරන බව දක්වේ.

පස්වන වගන්තිය

රටවැසියන් අදහන බුද්ධාගම හා දේවාගම් ද භික්ෂූන්වහන්සේලා හා වෙහෙර විහාර ද ආරක්ෂා කරන බව සඳහන් වේ.

හය සහ හත්වන වගන්ති

අංග ඡේදනය වැනි පැරණි දඬුවම් ක්‍රම අහෝසි කරන බව හා මරණ දඬුවම පැමිණවීම ආණ්ඩුකාරවරයාගේ බලය මත සිදු කරන බව දක්වේ. (ල. 02)

2. රජෙකු නොමැති වීම නිසා ජනතාව තුළ ඇති වූ කලකිරීම, බ්‍රිතාන්‍යයන්ගේ පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බියක් ඇති වීම, දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා බ්‍රිතාන්‍යයන් සිදු කරනු ලැබූ පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ නිසා ජන ජීවිතය වියවුල් වීම, රදල ප්‍රධානීන්ගේ බලතල, වරප්‍රසාද හා ආදායම් මාර්ග සුරක්ෂිත නොවීම, 1818 නිදහස් සටන සඳහා බලපෑ ආසන්නතම හේතුව වූයේ බහුතර සිංහල ජනයා වාසය කළ වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් වශයෙන් හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම නිසා සිංහල ජනයා අතර ඇති වූ විරෝධය යි. (ල. 03)

3. සටන විධිමත් ලෙස සංවිධානය වී නොතිබීම, ඉංග්‍රීසින් විසින් සටන අඩපණ කිරීමට යොදා ගත් දැඩි මර්දනකාරී ප්‍රතිපත්තියට මුහුණදීමට සටන්කරුවන්ට නොහැකි වීම, සටන මෙහෙයවූ නායකයන් අතර තිබූ පෞද්ගලික අමනාපකම්, ඉංග්‍රීසින්ගේ ආයුධ ශක්තියට මුහුණදීමට සටන්කරුවන්ට නොහැකි වීම, රජු ලෙස පෙනී සිටි දොරේසාමි නැමැත්තා නියම දොරේසාමි නොවන බව හෙළි වීම නිසා සටන්කරුවන් අධෛර්යයට පත් වීම (ල. 05)
(මුළු ල. 10)

(06) 1. ගොංගාලේගොඩ බණ්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්, පුරන් අප්පු හෙවත් ප්‍රැන්සිස්කෝ, ඩිංගිරාල, කඩහපොළ ස්වාමීන් වහන්සේ (ල. 02)

2. මඩුගල්ලේ දිසාව, කිවුලෙගෙදර මොහොට්ටාල, පිළිමතලව්වේ දෙවන අධිකාරම්, කැප්පෙටිපොළ නිලමේ, බූටෑවේ රටේ රාල, කොහුකුඹුරේ රටේ රාල (ල. 03)

3. සටන අවසානයේ ඊට හේතු සොයා බැලීම සඳහා බෙලි මහතාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කිරීම, කමිටුවේ යෝජනා අනුව ටොරින්ටන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත භාර ලේකම් එමර්සන් ටෙනන්ට් එම තනතුරුවලින් ඉවත් කොට එංගලන්තයට ආපසු කැඳවීම, වෙළෙඳ සැල් බද්ද සහ බලු බද්ද අවලංගු කරන ලද අතර මුද්දර බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද සංශෝධනය කිරීම, කෘෂිකර්මාන්ත හා වාරිමාර්ග කටයුතු දියුණු කිරීම සඳහා රජය පියවර ගැනීම, දළදා වහන්සේගේ භාරකාරත්වය නැවත වතාවක් බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට ගැනීම (ල. 05)
(මුළු ල. 10)



CamScanner